# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 14 දරන අධිකරණ භාෂා (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1973 අප්‍රේල් මස 11 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබා ගත හැකිය.

# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 14 දරන අධිකරණ භාෂා (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1973 මාර්තු මස 29 වන දින]

එල්. ඩී.—ඕ. 67/72.

**උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ මුල් අධිකරණ බලය ඇති ඇතැම් ආයතන සම්බන්ධයෙන්, දෙමළ භාෂාව භාවිතා කිරීම සඳහා විධිවිධාන යෙදීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකාව මුළුල්ලේම අධිකරණයන්හි සහ යුක්තිය පසිඳලීම සඳහා නීතියෙන් බලය ලබා ඇති විනිශ්චය අධිකාරයන්හි ද කාර්මික ආරාවුල් පනත යටතේ පිහිටුවන ලද අධිකරණයන්හි විනිශ්චය අධිකාරයන්හි සහ වෙනත් ආයතනයන්හි ද 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද සමගි මණ්ඩලවල ද කටයුතු සිංහල භාෂාවෙන් කළ යුතු බවටත්, ඒ අනුව ඒ අධිකරණයන්හි සහ විනිශ්චය අධිකාරයන්හි ද කාර්මික ආරාවුල් පනත යටතේ පිහිටුවන ලද අධිකරණයන්හි විනිශ්චය අධිකාරයන්හි හා වෙනත් ආයතනයන්හි ද 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද සමගි මණ්ඩලවල ද සිදුවන කාර්ය ආයාචන සහ නඩු තීන්දු ද ආඥා ද අධිකරණ සහ විධායක කාර්ය පිළිබඳ සටහන් ද වාර්තාගත කළ යුතු වෙනත් සියලු සටහන් ද සිංහල භාෂාවෙන් විය යුතු බවටත් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් විධිවිධාන සැලසී ඇති හෙයින් ද :

උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ මුල් අධිකරණ බලය ඇති ආයතන සම්බන්ධයෙන් ද කාර්මික ආරාවුල් පනත යටතේ පිහිටුවන ලද අධිකරණ විනිශ්චය අධිකාර සහ වෙනත් ආයතන සම්බන්ධයෙන් ද 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද සමගි මණ්ඩල සම්බන්ධයෙන් ද ජාතික රාජ්‍ය සභාව විසින් පනවනු ලබන නීතියකින් හෝ ජාතික රාජ්‍ය සභාව විසින් පනවනු ලබන නීතියක බලය යටතේ හෝ දෙමළ භාෂාව භාවිතා කිරීම සඳහා විධිවිධාන යෙදීමට, එකී උපවගන්තියේ අතුරු විධානයෙන් ජාතික රාජ්‍ය සභාවට බලය ලැබී ඇති හෙයින් ද :

**ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—**

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 14 දරන අධිකරණ භාෂා (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

කේ 19913—10,857 (73/2)

උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ අධිකරණ ආදියෙහි භාෂාව දෙමළ භාෂාව විය යුතු යයි නිශ්චය කිරීමට අමාත්‍යවරයාට බලය ඇති බව.

2. උතුරු පළාතේ හා නැගෙනහිර පළාතේ පිහිටියා වූ මුල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන යම් කිසි ආයතනයක ද කාර්මික ආරාවුල් පනත යටතේ උතුරු පළාතේ හා නැගෙනහිර පළාතේ පිහිටුවන ලද යම් කිසි අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ වෙනත් ආයතනයක ද 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනත යටතේ උතුරු පළාතේ හා නැගෙනහිර පළාතේ පිහිටුවන ලද යම් කිසි සමගි මණ්ඩලයක ද භාෂාව දෙමළ භාෂාව විය යුතු යයි අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව නිශ්චය කිරීමට අමාත්‍යවරයාට බලය ඇත්තේ ය.

2 වන වගන්තිය යටතේ කරන ලද නිශ්චයක බලපෑම.

3. මේ පනතේ 2 වන වගන්තිය යටතේ නිශ්චයක් කරනු ලැබූ විට, ඒ නිශ්චය කරනු ලැබුයේ යම් අධිකරණයක්, විනිශ්චය අධිකාරයක්, ආයතනයක් හෝ මණ්ඩලයක් සම්බන්ධයෙන් ද ඒ අධිකරණය, විනිශ්චය අධිකාරය, ආයතනය හෝ මණ්ඩලය—

(අ) ඉදිරියේ පැමිණිලි හා උත්තර ආදිය ද එහි සිදුවන කාර්ය යන්ද එහි තඩු තීන්දු සහ ආඥා ද අධිකරණ සහ විධායක කාර්ය පිළිබඳ සටහන් ද වාර්තා ගත යුතු කළ යුතු වෙනත් සියලු සටහන් ද දෙමළ භාෂාවෙන් විය යුතු බවට ද:

එසේ වුව ද අමාත්‍යවරයා විසින් ආඥා මගින් විධාන කරන එකී සෑම අවස්ථාවක ම වාර්තා ගත කර තැබීම සඳහා සිංහල පරිවර්තනයක් ඒ අධිකරණය විසින් හෝ විනිශ්චය අධිකාරය විසින් හෝ ආයතනය විසින් හෝ මණ්ඩලය විසින් හෝ පිළියෙල කරවා ගත යුතු බවට ද,

(ආ) ඉදිරියට පැමිණෙන පාර්ශ්වයන්ට අයදුම්කරුවන්ට සහ ඒ පාර්ශ්වයන් හෝ අයදුම්කරුවන් හෝ නියෝජනය කිරීමට නීතියෙන් බලය ලබා ඇති තැනැත්තන්ට—

(i) තම පැමිණිලි හා උත්තර ආදිය ද ඉල්ලීම් ද යෝජනා හා පෙත්සම් ද සිංහල භාෂාවෙන් ඉදිරිපත් කිරීමට අයිතිය ඇති බවට ද

(ii) ඒ අධිකරණයේ, විනිශ්චය අධිකාරයේ, ආයතනයේ හෝ මණ්ඩලයේ සිදුවන කටයුතුවලට තමන් සහභාගි වන විට සිංහල භාෂාව භාවිතා කිරීමට අයිතිය ඇති බවට ද:

එසේ වුව ද අමාත්‍යවරයා විසින් ආඥා මගින් විධාන කරන එකී සෑම අවස්ථාවක ම වාර්තාගත කර තැබීම සඳහා දෙමළ පරිවර්තනයක් පිළියෙල කරවා ගත යුතු බවට ද, තවද

(ඇ) ගම්බද අධිකරණයක හැර, එකී අධිකරණයක, විනිශ්චය අධිකාරයක, ආයතනයක හෝ මණ්ඩලයක තීන්දුවකට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබූ විට, (අ) ඡේදයේ අනුරූ විධානය යටතේ සිංහල පරිවර්තනයක් පිළියෙල කරවා ගනු ලැබ ඇතත් නැතත්, ඒ අභියාචනය විභාග කරන අධිකරණයේ ප්‍රයෝජනය සඳහා සිංහල භාෂාවෙන් නඩු වාර්තාවක් පිළියෙල කළ යුතු බවට ද

ඒ අධිකරණයට, විනිශ්චය අධිකාරයට, ආයතනයට හෝ මණ්ඩලයට අමාත්‍යවරයා විසින් විධාන කළ යුතු ය.

*යම් අධිකරණ ආදියෙහි භාවිතා වන භාෂාව පිළිබඳ දැනීමක් නොමැති තැනැත්තන්ගේ අයිතිවාසිකම.*

4. 2 වන වගන්තියේ දක්වෙන අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ වෙනත් ආයතනයක සිදුවන කාර්ය වටහාගෙන ඊට සහභාගි වීමට තරම් එහි භාවිතා වන භාෂාව පිළිබඳ දැනීමක් නොමැති පාර්ශ්වයන්ට, අයදුම්කරුවන්ට, විනිශ්චයකාරවරයන්ට, ජූරි සභිකයන්ට හෝ විනිශ්චය අධිකාරයන්හි සාමාජිකයන්ට එහි සිදු වන කාර්යයන් වටහා ගැනීමටත් ඒ කාර්යයන්ට සහභාගි වීමටත් හැකි වන සේ රජය විසින් සිංහල භාෂාවෙන් සපයනු ලබන භාෂණ පරිවර්තන සහ පරිවර්තන ලබා ගැනීමට අයිතිය ඇත්තේ ය. තව ද එකී තැනැත්තකුට නඩු වාර්තාවකින් නීතිය අනුව ලබා ගැනීමට හිමිකම් ඇති කවර වූ හෝ කොටසක් සිංහල භාෂාවෙන් ලබා ගැනීමේ අයිතිය ද ඇත්තේ ය.

*උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ මින්මතු පිහිටුවනු ලබන ආයතනවලට මේ පනත බලපෑම.*

5. 2 වන වගන්තියේ දැක්වෙන යම් කිසි ආයතනයකට අයත් කාර්යයකට හෝ අධිකරණ බලයකට හෝ අනුරූප වූ නැතහොත් සමාන වූ කාර්යයක් හෝ අධිකරණ බලයක් හෝ මතුවට පනවනු ලබන්නා වූ යම් කිසි නීතියකින් උතුරු පළාතේ සහ නැගෙනහිර පළාතේ යම් කිසි ආයතනයකට පැවරේ ද නැතහොත් ලැබේ ද ඒ ආයතනයට ද මේ පනතේ විධිවිධාන අදාළ වන්නේ ය.

*නියෝග.*

6. (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද කිසිම නියෝගයක් ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබ එසේ අනුමත කරනු ලැබූ බවට නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තුරු ක්‍රියාත්මක නොවන්නේ ය.